#mediaethicsSL #SinhalaPress #lka #Ada #Mawbima

දූෂණය, කෙළෙසීම වැනි වදන් භාවිතා කිරීම ඔස්සේ වින්දිතයාව අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වන බැවින්, ඒ සඳහා ලිංගික අපරාධය වැනි යෙදුම් භාවිතා කිරීම වඩාත් උචිත වෙයි. අප විසින් පහත දක්වා ඇති පුවත් වාර්තාවන් දෙක සංසන්දනය කර බලමු. මෙහි ප්‍රවෘත්තියේ ප්‍රධානතම අවධානය වන්නේ ඝාතනය වුවත්, එහිදී ලිංගික අපරාධයක් සිදුවී ඇතිද යන සැකයක්ද තිබෙනා අතර, එය නිශ්චිතවම අනාවරණය වී නොමැති බව පොලිසිය පවසයි. මෙම කරුණ පුවත්පත් දෙක විසින් යොදාගෙන ඇති එකිනෙකට වෙනස් ආකාරය සැලකිල්ලට ගැනීම වටී.